# පාසල් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ළමා අයිතිවාසිකම් සුරැකීමේ ස්වභාවය සම්බන්ධයෙන් පැනනගින ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම්.එල්. සීතා ජයවර්ධන
B.Ed., M.Ed., M.Phil.

මෙම පර්යේෂණ නිබන්ධය
කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන දර්ශන විශාරද උපාධිය
සඳහා ඉදිරිපත් කරනු ලබන්නකි.

UCLIB
539324

අධ්‍යාපන පීඨය - කොළඹ විශ්වවිද්‍යාලය
2007

University of Colombo
Library
Sri Lanka

# සංක්ෂිප්තය

මිනිසකු ලෙස ඉපිද මිනිසෙකු ලෙස මියයාමට පුද්ගලයකුට ඇති සදාතනික අයිතිය මානව හිමිකම් ලෙස හැඳින්වෙයි. එසේ වුව ද මානව හිමිකම් ක්‍රියාත්මක වීමේ දී විවිධ විෂමතා බලපා තිබේ. ළමා හිමිකම් ප්‍රඥප්තිය 1989 දි සම්මත වූ අතර අධ්‍යාපන අයිතිවාසිකම් මෙහි දී වැදගත් වෙයි. එසේ වුව ද අධ්‍යාපනයෙහි නියැලෙන බොහෝ අයට මානව හිමිකම් අවබෝධය ඉතා අඩුය. සැම අයෙකුටම එම අවබෝධය තිබේ නම් අධ්‍යාපන කටයුතු ඉතා පහසුවෙයි.

යුරෝපා රටවල මානව අයිතීන් පිළිබඳව විවිධ ගැටුම් ඇති විය. අමෙරිකන් නිදහස් සටන, ප්‍රංශ විප්ලවය ආදිය මගින් මානව හිමිකම් නීතිගත වීමට හේතු විය. රුසියන් විප්ලවය, මහත්මා ගාන්ධිතුමාගේ නිදහස් සටන හා ලෝක යුද්ධ මානව හිමිකම් පිළිබඳ අවධානයට මුල් වූ අතර, මෙම සාධක 1948 මානව අයිතිවාසිකම් ප්‍රඥප්තිය ස්ථාපනය වීමට හේතු විය. අද්‍යතන ලෝකයේ මානව හිමිකම් කෙරෙහි දැඩි අවධානයන් යොමු වී තිබේ.

මින් පසුව ළමා අයිතීන් පිළිබඳව දැඩි අවධානයක් ලොව පුරාම විද්‍යමාන වෙයි. ළමුන්ට වැඩිහිටියන්ගෙන් මුහුණපෑමට සිදු වූ ගැටලු නිසා ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය බිහි විය. මෙම අයිතිය තුළ අධ්‍යාපන අයිතියට ද විශේෂ ස්ථානයක් හිමි වූ අතර දැඩි අවධානයක් ද යොමු විය. අධ්‍යාපන පර්යේෂණ සඳහා ද අධ්‍යාපන අයිතිය භාවිතා කිරීම ආරම්භ විය.

ළමා හිමිකම් හා මානව හිමිකම් පිළිබඳව බොහෝ පර්යේෂණ ආරම්භ වනුයේ 1989 න් පසුව බව විද්‍යමාන වෙයි. එසේ වුව ද පංති කාමරය පදනම් කර ගත් පර්යේෂණ සිදු කිරීම බහුල ලෙසම ආරම්භයේ දි දක්නට නැත. මානව හිමිකම් පිළිබඳ න්‍යායාත්මක පර්යේෂණ විමර්ශනය කිරීමේ දි මානව හිමිකම් උගන්වන ආකාරය, විෂයය නිර්දේශ පිළියෙල කිරීම, වීදි දරුවන් පිළිබඳ අයිතිවාසිකම්, සදාචාර අධ්‍යයනය, කම්කරු අධ්‍යයනය, වැඩිහිටි අධ්‍යාපනය, පරිසර අධ්‍යාපනය ආදිය පිළිබඳව අවධානය යොමු කර ඇති බව පෙනේ.

ළමා හිමිකම් පිළිබඳ න්‍යායාත්මක අධ්‍යයන මගින් ළමා ශ්‍රමය, ප්‍රාථමික අධ්‍යාපනය, වැඩ ලෝකයට ළමුන් සම්බන්ධ කිරීම, පුම්තිරි බව, පහළ ආදායම් තත්වය, ඉගැන්වීමේ ක්‍රම පිළිබඳව අවධානය යොමු කර තිබේ. අනුභවික පර්යේෂණ මගින් ළමා අයිතින් හා ඒවා ඇගයීමත්, ඉගෙනුම් ද්‍රව්‍ය පිළිබඳවත්, ළමා හිමිකම් ඉගැන්වීම, පාඩම් සටහන් භාවිතය, ආබාධිත සිසුන්ගේ ළමා අයිතින් පාඩම් ඉගැන්වීම, සාම අධ්‍යාපනය ආදිය පිළිබඳව අධ්‍යයනය යොමු කර ඇත. පාසල් සිසුන්ගේ ළමා හිමිකම් ආරක්ෂා වීම පිළිබඳව කරන ලද අධ්‍යයන ඉතා විරලය.

මෙම අධ්‍යයනයෙහි අරමුණු වශයෙන් පංති කාමරය තුළ පවතින ප්‍රජාතන්ත්‍රවාදි වාතාවරණය, ගුරුවරුන් නිසි කලට විෂය නිර්දේස නිම කර ඇගයීම් කිරීම, පංති කාමරය තුළ සමාන අයිතිවාසිකම් ළමුන්ට ලැබීම, පංති කාමරය තුළ ළමුන්ට ශාරීරික හා මානසික දඬුවම් ලැබීම පිළිබඳව විමසා බැලීම යොදා ගන්නා ලදි.

මෙම අධ්‍යයනයෙහි නියැදිය වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කයෙහි අත්තනගල්ල, ගම්පහ, කැලණිය, මීගමුව, මිනුවන්ගොඩ යන අධ්‍යාපන කලාප නියෝජනය වන පරිදි 1 ඒ බී හා, 1 සි, 2 වර්ගයේ පාසල්වල සිසුන් 750 ක් ද ගුරුවරුන් 90 ක් ද, විදුහල්පතිවරුන් 65 ක් ද දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි සම්මුඛ සාකච්ජා හා නිරීක්ෂණ ද භාවිතා යොදා ගන්නා ලදි. දත්ත විශ්ලේෂණය අධ්‍යයනයෙහි අරමුණු පාදක කරගෙන පර්යේෂණ ප්‍රශ්න ඇසුරින් සිදු කළ අතර දත්ත රැස් කළ ප්‍රධාන උපකරණය වූ ප්‍රශ්නාවලිය තුළින් අනාවරණය වූ කරුණු අනෙකුත් සම්මුඛ සාකච්ජා නිරීක්ෂණ ඇසුරින් තහවුරු කිරීමට උත්සාහ දරන ලදි. ඒ අනුව ගනු ලැබූ ප්‍රධාන නිගමන පහත සඳහන් වෙයි.

ගම්පහ අධ්‍යාපන දිස්ත්‍රික්කයට අයත් පාසල්වල නියැදියට අයත් සිසුන් දක්වන පරිදි බොහෝ සිසුහු සතුටින් පංති කාමරවල අධ්‍යාපනය ලබති. අන්‍ය සිසුන් සමග සාකච්ජා කරමින් කරුණු සොයමින් ඉගෙනීමට බොහෝ සිසුන්ට අවස්ථාව නොලැබේ. ගුරුවරුන් සිසුන්ගේ පෞද්ගලික තොරතුරු සොයා බලා ඉගැන්වීම ද සෑහෙන සිසු පිරිසකට නොලැබෙන බව පෙනේ. විදුහල්පතිවරුන් දක්වන පරිදි ළමයි ආචාර ධර්ම අනුව ක්‍රියා කරති. ප්‍රජාතන්ත්‍රවාදි වාතාවරණය පංති කාමරය තුළ නිසි පරිදි විද්‍යමාන නොවෙයි. ළමා චින්තනය වර්ධනය වීම යම් පමණකින් සිදුවෙයි. ස්වයං ඉගෙනුමට සිසුන්ට අවස්ථාව අඩු වෙයි. ගුරුවරුන්ගේ ඉගෙනීමට ඇපකැපවීම ළමුන් දක්වන පරිදි ඉතා අඩුය. අන් අදහස්

ගුරු කිරීමට ළමුන්ට ඇති අවස්ථාව ප්‍රමාණවත් නැත. අන් අදහස් ගරු කිරීමේ දී සවන් දීමට අවස්ථාව නිසි ලෙස නොලැබේ.

දරුවන් දෙමාපියන්ගෙන් අපහසු වැඩ කොටස් අසා දැන ගැනිම ද සැම විටම සිදු නොවෙයි. දෙමාපියන් දරුවන්ට ඉගෙනිමට උපකාර කිරීමත්, සිසුන් අපහසු විෂයය කොටස් ගුරුවරුන්ගෙන් අසා දැන ගැනිමත් විරලව සිදුවෙයි. බොහෝ විට ගුරුවරුන් පාසල සහ මිත්‍රශීලි අයගේ දරුවන්ට පාසල තුළ විෂයය බාහිර හා විෂයය බද්ධ ක්‍රියාකාරකම්වල දි විශේෂ වරප්‍රසාද ලබා දි තිබේ. ගුරුවරුන් සිසුන් පිළිබඳව අවබෝධයෙන් ක්‍රියා කිරීම හැම විටම සිදු නොවෙයි.

සිසුන්ට නිදහස් ලෙස තමන් කැමති විෂයයන් තෝරා ගැනිමට පාසල තුළ ඉඩ ප්‍රස්ථා ඉතා මඳය. ගුරුවරුන් ළමුන්ට අපහසු විෂය කරුණු පිළිබඳව ප්‍රශ්න ඇසිමට ඉඩ ප්‍රස්ථා ලබා දිම ද හොඳින් සිදුවන්නක් නොවේ. ගුරුවරුන් විෂය නිර්දේශ නිසි ලෙස අවසන් කරන්නේ නැත. විෂයය නිර්දේශ ළමුන්ගේ අවශ්‍යතා සපුරාලනු නොලබයි. ගුරුවරු විශේෂයෙන් තෝරා ගත් ළමුන්ට විශේෂ සැලකිලි දක්වති. සිසුන්ට සමාන අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ගුරුවරුන් විසින් ලබා දිම ඉතා මඳය.

සමාජ, ආර්ථික ප්‍රශ්න නිසා ළමුන් පාසල් අධ්‍යාපනයට හානි කරගෙන තිබේ. ගුරුවරයා උගන්වන විෂයය කරුණු තේරුම් ගත නොහැකි සිසුහු පංති කාමරයේ සිටිති. සිසුන්ගේ ගැටුම් නිසා පිඩාවට පත් ළමයි සිටිති. විෂයය බාහිර ක්‍රියාකාරකම් නිසා ඇති වූ ආරවුල් මත කායික මානසික පිඩාවට ළමයි පත්වෙති. ගුරුවරු සිසුන්ට පංති කාමරය තුළ දඬුවම් දෙති, විෂය දුෂ්කරතා ඇති සිසුන්ට ගුරුවරු දඬුවම් කරති. සිසුන් පිළිබඳ මනා අවබෝධයකින් ක්‍රියා කරන ගුරුවරුන් අඩුය. ගුරුවරුන්ට සිසුහු බියවෙති. සැර පරුෂ ගුරුවරුන් නිසා ඉගෙනුම දුර්වල කර ගන්නා සිසුහු සිටිති.

දෙමාපියන්, විදුහල්පතිවරුන් හා ගුරුවරුන්ට ළමා හිමිකම් පිළිබඳ අවබෝධය ඉතා දුර්වල නිසා මොවුන් ළමා හිමිකම් පිළිබඳව දැනුවත් කළ යුතුය. එපමණක් නොව මොවුන්ගේ ආකල්ප වර්ධනය වන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

ළමයා තුළ පවතින පසුබටතාව නිර්මාණ දුර්වලකමක් නොව ස්වභාවයක් බවත් බොහෝ දෙනෙකු තුළ මෙම ස්වභාවය පරිනතිය අනුව දියුණු කළ හැකි බවත් අවබෝධ කළ යුතුය.

ගුරුවරයා ළමුන්ට ඍජු ලෙසට සම්බන්ධ වන නිසා ළමුන්ගේ ශක්‍යතා, නිර්මාණශීලිත්වය, විවිධතා, සමානතා මිනිස් ස්වභාවය නිසා ඒවා ළමා අයිතින් ලෙස සලකා ඉගැන්වීම් සංවිධානය කළ යුතුය.

තම ළමුන්ගේ ගැටලු ගුරුවරුන්ගෙන් විමසා සිටීමට දෙමාපියන් හුරු කළ යුතුය. මෙම සියලු අවබෝධයන් ගුරුවරුන්ට මෙන්ම අධ්‍යාපන පරිපාලකයන්ට හා ප්‍රතිපත්ති සම්පාදකයන්ට ද ලබා දිය යුතුය.

එපමණක් නොව ආබාධිත ළමුන් සඳහා විශේෂ අවධානයක් යොමු කිරීම මගින් ඔවුන්ගේ අයිතිවාසිකම් ලබා දිය හැකිය.